# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/18 - 2017 ජනවාරි මස 17 වැනි අඟහරුවාදා - 2017.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: බිය/3/1/1/241.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වල්ගම ගමේ පිහිටි මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති මු.පි. ගම් 4033 සහ 2016.10.26 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 04 දක්වා පෙන්නුම් කෙරෙන ප්‍රමාණය හෙක්ටයාර් 0.0462 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හතර (04).

**1.කැබලි අංක 01**

ඉඩමේ නම:වරිපනම් අංක 44, මහවීදිය; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය:රජය;මුල් හිමිකම් කියන අය: පීපීඒ 1702 කැබලි අංක 1 හි කොටසකි. අංක 511/3ඒ, වල්ගම, මල්වාන පදිංචි එල්. ජයවර්ධන පෙරේරා විසින් අනවසරයෙන් භුක්ති විඳියි; ප්‍රමාණය:0.0026

**2. කැබලි අංක 02**

ඉඩමේ නම: වරිපනම් අංක 44, මහවීදිය; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: අංක 636බී, මල්වත්ත, මල්වාන පදිංචි එම්. එම්. ඒ. ෆායිස් සහ අංක 185/2බී, බුරුලුපිටිය, මල්වාන පදිංචි ඒ. සී. එම්. හුසේන්; මුල් හිමිකම් කියන අය: අංක 511/3ඒ, වල්ගම, මල්වාන පදිංචි එල්. ජයවර්ධන පෙරේරා විසින් අනවසරයෙන් භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0006

**3. කැබලි අංක 03**

ඉඩමේ නම: වරිපනම් අංක 44, මහවීදිය; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: අංක 636බී, මල්වත්ත, මල්වාන පදිංචි එම්. එම්. ඒ. ෆායිස් සහ අංක 185/2බී, බුරුලුපිටිය. මල්වාන පදිංචි ඒ. සී. එම්. හුසේන්; මුල් හිමිකම් කියන අය: පීපීඒ 1702 කැබලි අංක 2හි කොටසකි. අංක 511/3ඒ, වල්ගම, මල්වාන පදිංචි එල්. ජයවර්ධන පෙරේරා විසින් අනවසරයෙන් භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0009

**4. කැබලි අංක 04**

ඉඩමේ නම: ඉලුක්ඕවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ තාවකාලික ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: අංක 636බී, මල්වත්ත, මල්වාන පදිංචි එම්. එම්. ඒ. ෆායිස් සහ අංක 185/2බී, බුරුලුපිටිය. මල්වාන පදිංචි ඒ. සී. එම්. හුසේන්; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0421

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24942 - 42 - (2017/01)

තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හි දී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

| *දිනය* | *කැබලි අංකය* | *වේලාව* |
|---|---|---|
| 2017.03.08 | 01 සිට 04 | පෙ.ව. 10.00 |

තව ද, 2017 පෙබරවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2017 ජනවාරි මස 13 වැනි දින,
සපුගස්කන්ද, මාකොල, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-70

## නිවැරදි කිරීමයි
## 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

2014.05.12 වැනි දින පළවූ අංක 1862/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉමියන්ගොඩ ගමෙහි පිහිටි අ.ග.පි. 2531, KU/BMK/2013/81 අංකය යටතේ වූ කැබලි අංක 52 දරන ඉඩම් කොටසෙහි ප්‍රමාණය ''හෙක්ටයාර් 0.0088'' ක් ලෙස නිවැරදි විය යුතුය.

ඒ. එම්. පී. අරම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
බමුණාකොටුව.

2017 ජනවාරි මස 04 වැනි දින,

02-911

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.